ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක: HRC/P/i/S/17/04/23

**මාධ්‍ය නිවේදනය**

2023 සිංහල සහ දෙමළ අළුත් අවුරුද්දෙන් පසුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ රාජකාරී අද දින ආරම්භ කරන ලදී. සම්ප්‍රදායානුකූලව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සිංහල සහ දෙමළ අළුත් අවුරුද්දෙන් පසුව පළමුව වැඩ ආරම්භ කරන දින පැවැත්වෙන තේපැන් සංග්‍රහය අද දින සභාපතිනි විනිසුරු රෝහිණී මාරසිංහ මැතිණියගේ ප්‍රධානත්වයෙන් පැවත්වුණි.

මෙම තේපැන් සංග්‍රහය සඳහා කාර්ය මණ්ඩලයේ සියළුදෙනා ද සහභාගී විය. එහිදී කාර්ය මණ්ඩලය ඇමතූ සභාපතිතුමිය විසින් මෙසේ පැවසීය,

"මා හා එක්ව සිංහල හා දෙමළ අළුත් අවුරුද්ද සමරන ඔබට කීමට යමක් ඇත. මේ ආයතනයේ වැඩ කටයුතු සාර්ථක කර ගැනීම උදෙසා ඔබ සියළුදෙනා ලබාදෙන සහයෝගය මා ඉතා අගය කරනු ලබන අතර, ඔබ සියළුදෙනාම එක්ව දුන් සහයෝගය නොවේනම් මට එම කාර්ය කිරීමට නොහැකි වනු ඇත.

පසුගිය දිනවල මා හට එරෙහිව මාධ්‍ය මගින් ප්‍රචාරය වූ චෝදනා ගැන මා මහත් ලෙස කනස්සල්ලට පත් වුණෙමි. එම වාර්තා වලට අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතට පටහැනිව මා කටයුතු කරන බව සමහර කොමසාරිස්වරුන්ගේ මතය වී ඇත. ඔවුන්ගේ තීරණ මා නොසළකා හරින බවත්, ඔවුන් මේ බව ජනාධිපතිතුමා වෙත ලිපියකින් දන්වා ඇති බවත්, මාධ්‍යයන්හි නිතර ප්‍රචාරය වෙමින් පවතී. මානව හිමිකම් උල්ලංඝනය කළ අවස්ථාවලදී ඔවුන් ගත් තීරණ මා නොසළකා හැර ඇත්නම් ඒ බව ජනාධිපතිතුමා වෙත දැන්වීම සාධාරණ වේ, එසේම උචිතද වේ.

එහෙත් ඊට ප්‍රථම එම තීරණ කුමක්දැයි අවම වශයෙන් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දන්වා සිටීම තරම් ඔවුන් විචක්ෂණශීලී විය යුතුය යන්න මාගේ අදහසයි. ඒවා ඔබ වෙත දන්වා සකච්ඡා කළ යුතුව තිබුණේ යැයි මම විශ්වාස කරමි. එහෙත් තවමත් එම තීරණ මොනවාදැයි මා වෙතද දන්වා නොමැත. මානව හිමිකම් උල්ලංඝනය කර ඇති අවස්ථාවලදී ඔවුන් ඉදිරිපත් කළ, මා නොසළකා හැර ඇතැයි ඔවුන් ප්‍රකාශ කරන තීරණ සාකච්ඡා කිරීමට මා තවම සූදානමින් සිටී, එය අත්‍යාවශ්‍ය කරුණක් ද වේ.

මානව හිමිකම් කොමිෂන් සභාව සහ අධ්‍යක්ෂ මණ්ඩලය සමග සාකච්ඡා නොකොට මාගේ අභිමතය පරිදි කිසිම තීරණයක් සභාපතිනිය වශයෙන් මා ගෙන නොමැත. අප සැමදෙනාගේම එකම අරමුණ, එකම පරමාර්ථය විය යුත්තේ, මෙතෙක් අප ලබා ගත්තා වූ කීර්ති නාමය ඉදිරියටත් රඳවා තබා ගැනීම සඳහා එක්සත්ව, එක්සිත්ව කටයුතු කිරීම පමණක් යැයි මා තරයේ විශ්වාස කරනු ලබන අතර, ඒ සඳහා ඔබ සැමගේ සහයෝගය ඉතසිතින් අපේක්ෂා කරමි. ඔබ සැමට සුභ නව වසරක් වේවා!!! ස්තුතියි."

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2023.04.17